**ශීර්ෂය 193 - කම්කරු අමාත්‍යාංශය**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

කම්කරු.අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කම්කරු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) පහත සඳහන් අවස්ථාවේ හැර මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට , මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ පූර්ව වර්ෂයේ අවසාන ශේෂ මෙම වර්ෂයේ සැසඳුම් ලෙස ඉදිරිපත් කිරීමේදී පූර්ව වර්ෂයේ පැවති ශේෂවලට,ජාතික එළදායිතා ලේකම් කාර්යාලයෙන් වර්ෂය තුළදී පවරා ගන්නා ලද ශේෂ එකතු කර තිබූ නමුත් මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය හා කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය හා කාර්යසාධන වාර්තාවට අනුව අමාත්‍යාංශය සඳහා ශීර්ෂ අංක 193 හා 054 යටතේ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම රු.597,229,588 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත අනුව එම ලැබීම් රු.598,054,000 ක් බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඒ අනුව මූල්‍ය හා කාර්යසාධන වාර්තාව හා භාණ්ඩාගාර මුද්‍රිත අතර අග්‍රිම ලැබීම්වල රු.824,412 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය හා කාර්යසාධන වාර්තාව හා භාණ්ඩාගාර මුද්‍රිත අතර අග්‍රිම ලැබීම්වල රු.824,412 ක වෙනසක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය කර තිබුණද සත්‍ය වශයෙන්ම සකස් කරන ලද වාර්තා පිරික්සීමේදී සනාථ වූයේ රු.131,273.55 ක වෙනසක් පවතින බවයි. මෙම වෙනස රු.131,273.55 දක්වා පහළ යාමට හේතු වූයේ විදේශ කටයුතු/ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සඳහා නිදහස් කළ වටිනාකම විගණකයින් විසින් රු.850,591,194 ක් ලෙසද භාණ්ඩාගාර පියවීම් රු.30,600,806 ලෙස ද පදනම් කරගෙන තිබූ නමුත් එම නිවැරදි අගයන් පිළිවෙලින් රු.882,392,000 ක් හා රු.31,293,944 පරිදි විය වූ යුතු බැවිනි. | මූල්‍ය කාර්යසාධන වාර්තාවට සියලු අග්‍රිම ලැබීම් එකතු කර දැක්විය යුතු අතර නොපියවන ලද අග්‍රිම අඩුකර දැක්විය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා භාණ්ඩාගාර මුද්‍රිත අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම්වල පිළිවෙලින් රු.174,605 ක හා රු.324,726 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | එම වෙනස්කම් නිරීක්ෂණය වී ඇත්තේ ජාතික එලදායීතා ලේකම් කාර්යාලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ශීර්ෂ අංක 130 යටතේ ක්‍රියාත්මක වූ කාලපරිච්ඡේදයට අදාලව 6000-13-045 හා 6000-18-033 අංක දරණ තැන්පත් ගිණුම් හරහා ගිණුම්ගත වූ වටිනාකම් පිළිබඳව අවධානය යොමු කිරීමකින් තොරව විගණන නිරීක්ෂණ ඉදිරිපත් කර ඇති හෙයිනි. | ශේෂ පවරා ගැනීම ගිණුම්ගත කිරීමේදී අයවැය චක්‍රලේඛ මගින් දී ඇති උපදෙස් පරිදි ක්‍රියාකල යුතු වීම. |
| (ඇ) | 2020 නොවැම්බර් 30 දිනැති අයවැය චක්‍රලේඛ අංක 06/2020 හි 14 ඡේදය අනුව යම් අමාත්‍යාංශයකට අදාල කාර්යන්ගෙන් කොටසක් පමණක් වෙනත් අමාත්‍යාංශ වෙත පවරන අවස්ථාවලදී හුවමාරු වන කාර්ය මණ්ඩලය සලකා බලා ණය ශේෂයන් මාරු කිරීමට කටයුතු කල යුතුය. ඒ අනුව 2020 සැප්තැම්බර් 01 දින කම්කරු අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබූ එලදායිතා ලේකම් කාර්යාලයේ අත්තිකාරම් බී ගිණුමේ ආරම්භක ශේෂය වූ රු.40,851,695 ක් අත්තිකාරම් ගෙවීම් ලෙස ණය ශේෂ මාරු කර නිවැරදිව මූල්‍ය කාර්යසාධන වාර්තාවට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය කාර්යසාධන වාර්තාවෙන් නිරූපණය කරනුයේ කාලපරිච්ඡේදයට අදාල ලැබීම් හා ගෙවීම් පමණක් වන බැවින් ආරම්භක ශේෂයෙන් පවරා ගැනීම මූල්‍ය කාර්යසාධන වාර්තාවෙන් නිරූපණය නොකරන බවත් විගණනයෙන් හඳුනාගත් රු.37,871,056 ක වෙනසට හේතුව එසේ ආරම්භක ශේෂය වශයෙන් හඳුනාගනු ලැබූ තත්ත්වය බවත් වැඩිදුරටත් පෙන්වා දීමට කැමැත්තෙමි. | -එම- |
| (ඈ) | භාණ්ඩාගාර අවසාන මුද්‍රිත ප්‍රකාශ හා සැසඳීමේදී ගිණුම් ප්‍රකාශනවල හා ඒ.සී.ඒ-5 වාර්තාවේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් රු.2,980,639 බැගින් වැඩියෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර සටහන්වලට අනුව 054 ශීර්ෂය යටතේ පැවති කාලපරිච්ඡේදයේදී එනම්, 2020 ජනවාරි මස සිට අගොස්තු මස දක්වා කම්කරු අමාත්‍යාංශයේ 54 - 11 යටතේ හරස් සටහන් මගින් බැර වූ රු.1,478,052.19 ක වටිනාකමින් සහ 54 - 12 යටතේ හරස් සටහන් මගින් බැරවූ රු.666,327 ක වටිනාකමින් කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයට අදාලව 54 -11 යටතේ මුදලන් බැරවූ රු.835,810 ක් යන වටිනාකම් තුනෙහි එකතුව විගණන වාර්තාවේ වූ නිරීක්ෂණයෙන් වෙනසක් ඇති බවට පෙන්වා දෙන මෙම වටිනාකම ගොඩනැගී ඇත. ඒ අනුව, එය වෙනස්කමක් නොවන බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | -එම- |

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

---

**1.6.2.1 මූල්‍ය නොවන වත්කම්**

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම්වල 2020 ජනවාරි 01 දිනට ශේෂය රු.491,612,257 ක් විය යුතු වුවත් 2020 මූල්‍ය ප්‍රකාශ අනුව ආරම්භක ශේෂය රු.575,878,787 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව ආරම්භක ශේෂය රු.84,266,530 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති රු.84,266,530 ක ආරම්ක ශේෂයෙහි පවතින වෙනස කම්කරු අමාත්‍යාංශය යටතට පවරාගත් ජාතික එලදායීතා ලේකම් කාර්යාලයේ 2020 ජනවාරි 01 දිනට පැවති ශේෂයයි. එම මුදලින් රු.55,365,211 ක මුදලක් පමණක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් පවරා දී ඇති අතර එහි ඉතිරි මුදල 2021 වර්ෂයේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ඇත. | පවරාගත් වත්කම්වල වටිනාකම වර්ෂය තුල පවරා ගැනීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතුය. |
| (ආ) මූල්‍ය ප්‍රකාශවල ඒසීඒ-6 ආකෘතියේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම් පිලිබඳ ප්‍රකාශය සහ භාණ්ඩාගාර සටහන් (SA-80) අතර මූල්‍ය නොවන වත්කම්වල රු.18,973,067 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇති මූල්‍ය නොවන වත්කම්වල අගය රු.18,973,067 ක වෙනසක් පවතින බව විගණනයේදී පෙන්වා දී ඇත. එලදායීතා ලේකම් කාර්යාලයට අදාල මූල්‍ය නොවන වත්කම් ශේෂය වූ රු.84,286,529.75 ක වටිනාකමින් රු.55,305,211 ක කොටසක් පමණක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් 130 ශීර්ෂයේ සිට අමාත්‍යාංශයේ ශීර්ෂය වන 193 වෙත 2021 පෙබරවාරි 28 දින වන විට පවරා දී ඇතත්, ඉතිරි වටිනාකම නිරවුල් කරගත යුතු බැවින් එය 2021 වර්ෂයේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මගපෙන්වීම්වලට අනුකූලව සහ භාණ්ඩාගාර ගිණුම්වලට අනුකූල වන පරිදි හැකිතාක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇති මූල්‍ය නොවන වත්කම්වල අගය රු.582,687,237 ක් වුවද 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය අනුව එම ශේෂය (SA-80) රු.563,714,170 ක් විය. ඒ අනුව එම ප්‍රකාශ අතර මූල්‍ය නොවන වත්කම්වල රු.18,973,067 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම-. | -එම-. |

**1.6.2.2 මූල්‍ය වත්කම්**

----------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි මාර්ගෝපදේශ අංක 6, 7(v) ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධනය යටතේ දක්වා තිබූ ශුද්ධ වත්කම් ශේෂය ලබාගත යුත්තේ අමාත්‍යාංශයේ අත්තිකාරම් ගිණුම් වටිනාකමින් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙනි. ඒ අනුව රු.39,049,635 ක් ශුද්ධ වත්කම් ලෙස දැක්විය යුතු වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ ශුද්ධ වත්කම් ප්‍රමාණය රු.38,779,611 ක් වන අතර වෙනස රු.270,024 ක් විය. | මෙම වටිනාකම විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් 2020 වර්ෂයේදී පැවති මහ මැතිවරණ රාජකාරි වෙනුවෙන් දැරූ වියදම පියවීම සඳහා වූ අග්‍රිම වටිනාකමයි. තවද, මෙම මුදල 2021 වර්ෂයේ ජනවාරි මස භාණ්ඩාගාරයෙන් පියවීමට කටයුතු කර ඇත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මගපෙන්වීම්වලට අනුකූලව හා භාණ්ඩාගාර ගිණුම්වලට අනුකූල වන පරිදි හැකිතාක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම |
| (ආ) | මූල්‍ය නොවන වත්කම්වල අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.18,973,067 ක් වැඩියෙන් දැක්වීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම් යටතේ දේපල පිරියත හා උපකරණ සංචිතයද එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශයේ දැක්වෙන දේපල පිරියත හා උපකරණ සංචිත වටිනාකම රු.18,973,067 කින් වැඩියෙන් දක්වා ඇති බව පිළිගන්නා අතර ඊට හේතුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් නිරවුල් කරගත යුතු මුදලේ ඉතිරිය වේ. කෙසේ වෙතත්, 2021 වර්ෂයේදී එම මුදල නිරවුල් කර ගැනීමට ක්‍රියාකරන බව වැඩිදුරටත් පෙන්වා දෙමි. | -එම-. |

**1.6.3** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණය වූ රු.628,654,806 ක් අග්‍රිම ලැබීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වුවත් අග්‍රිම ලැබීම් ලෙස රු.628,523,532 ක් දක්වා තිබුණි. මේ අනුව රු.131,274 ක් අඩුවෙන් අග්‍රිම ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | වර්ෂය තුලදී භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණයත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු අග්‍රිම ලැබීම් ලෙස සඳහන් වටිනාකමත් අතර රු.131,274 ක වෙනසක් පවතින බව විගණනයෙන් පෙන්වා දී ඇත. එය පිළිගන්නා නමුත් ඉහතින් සඳහන් කල 1.5.1.1 (අ) යටතේ පෙන්වා දී තිබූ අග්‍රිම ලැබීම්වල රු.824,412 ක වෙනසත් අතර විගණන නිරීක්ෂණවල පරස්පරතාවයක් පෙනී යන බවත් එම වෙනසට හේතුව 2020 ජූලි 05 වන දින චෙක්පත් අංක 017892 මගින් ප්‍රතිපූර්ණය කරන ලද මැතිවරණ රාජකාරි වෙනුවෙන් වූ රු.693,138 ක මුදලයි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මගපෙන්වීම්වලට අනුකූලව හා භාණ්ඩාගාර ගිණුම්වලට අනුකූල වන පරිදි හැකිතාක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම |
| (ආ) | වර්ෂය සඳහා ශීර්ෂ අංක 054 හා 193 යටතේ අමාත්‍යාංශය විසින් දරන ලද පුද්ගල පඩිනඩි**,** මෙහෙයුම් වියදම් හා සහනාධාර සහ මාරුකිරීම් ලෙස රු.623,295,556 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබූ නමුත් ශේෂ පිරික්සුම හා ඒසීඒ-2(ii) වියදම් ප්‍රකාශ අනුව එම වියදම රු.621,217,511ක් විය. ඒ අනුව ශේෂ පිරික්සුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය අතර පුද්ගල පඩිනඩි**,** මෙහෙයුම් වියදම් හා සහනාධාර සහ මාරුකිරීම්වල රු.2,078,045 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනසට හේතුව වනුයේ ප්‍රාග්ධන වියදම් යටතේ නිරූපණය කල යුතු වියදම් මෙහෙයුම් වියදම් යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අතපසුවීමකින් සඳහන් කර තිබීමයි. ඉදිරියේදී මෙම ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් එක් එක් උප ශීර්ෂයන් යටත් නිවැරදිව නිරූපණය කිරීමට පියවර ගෙන ඇත. | -එම- |

### 1.6.3.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කරගැනීම් සඳහා වර්ෂය තුලදී වැයකරන ලද මුදල් රු.6,788,450 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. මේ තුළ වන්දි කොමසාරිස් කාර්යාලයෙන් මාරු කරන ලද වත්කම් අගය රු.5,429,776 ක්ද ඇතුලත් කර තිබුණි. කෙසේ වුවද ශීර්ෂ අංක 054 හා 193 ශේෂ පිරික්සුම් අනුව එම වියදම රු.2,078,047 ක් විය. ඒ අනුව රු.4,710,403 ක වෙනසක් නිරීක්ෂණය විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් සඳහා වර්ෂය තුලදී වැය කරන ලද මුදල් වන රු.6,788,450 ක වටිනාකම, ACA-6 ආකෘතියෙන් ඉදිරිපත් කර ඇති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය - 2020 හි යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ 6112 කේතය යටතේ පෙන්වා ඇති වටිනාකම්වලින් පහත පරිදි නිර්මාණය වී ඇත. | වර්ෂය තුලදී වැය කරන ලද මුදල් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වැය කිරීම්වලට ඇතුලත් කල යුතු වීම |

| **අත්පත් කර ගැනීම** | **කේතය** | **වටිනාකම (රු.)** |
|---|---|---|
| ප්‍රවාහන උපකරණ | 61121 | 3,700,000 |
| වෙනත් යන්ත්‍රෝපකරණ (1,729,776 – 1,576,117) | 61122 | 3,305,893 |
| | | 7,005,893 |
| **අපහරනයන්** | | |
| වෙනත් යන්ත්‍රෝපකරණ | 61122 | (217,443) |
| ශුද්ධ වටිනාකම | | **6,788,450** |

## 1.6.4 අග්‍රිම ගිණුමේ ශේෂය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඒ.සී.ඒ-3 ප්‍රකාශය අනුව විදේශ රැකියා අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද ශුද්ධ අග්‍රිම ප්‍රමාණය රු.61,630,129 ක් වුවද එහි නිවැරදි ශේෂය රු.61,498,856 ක් වූයෙන් විදේශ රැකියා අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද අග්‍රිම රු.131,274 ක් වැඩියෙන් දක්වා තිබුණි.තවද ඒ.සී.ඒ-3 ප්‍රකාශයේ 2020 දෙසැම්බර් 31 දිනට යටතේ උප අග්‍රිම ශේෂය යටතේ කම්කරු අමාත්‍යාංශයට අදාල ශේෂය ලෙස රු.270,024 ක් දක්වා තිබූ නමුත් නිවැරදි ගණනය කිරීම් අනුව එම ශේෂය රු.138,750 ක් විය යුතු බව නිරීක්ෂණය විය. | මෙය විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත පියවිය යුතු මැතිවරණ කටයුතු සඳහා දරණ ලද වියදම් වෙනුවෙන් වූ අග්‍රිම ශේෂයයි. 2021 ජනවාරි මස මෙම වටිනාකම භාණ්ඩාගාරය විසින් පියවීමට කටයුතු කර ඇත. | ගිණුම් ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි ගණනය කිරීම් ඇතුලත් කර හැකිතාක් නිවැරදිව පිළියෙල කලයුතු වීම. |

## 1.6.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂය තුලදී අමාත්‍යමණ්ඩල ව්‍යුහයේ සහ අන්තර්ගතය අවස්ථා කිහිපයකදී වෙනස්වීම්වලට අනුව 2020 නොවැම්බර් 30 දිනැති අංක 06/2020 දරන මුදල් අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2020 ජනවාරි 01 දින සිට 2020 අගෝස්තු 31 දක්වා වන කාලය තුල දරන ලද වියදම්, ගැලපීම්, අත්තිකාරම් ණය ශේෂයන් මාරු කිරීම්, තැන්පතු ශේෂ මාරු කිරීම්, මූල්‍ය නොවන වත්කම් පැවරීම් යනාදිය ජර්නල් සටහන් මගින් මාරුකල යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අමාත්‍යාංශය විසින් 2020 සැප්තැම්බර් 01 සිට කම්කරු අමාත්‍යාංශයට එකතු වූ හා ඉවත් වූ ආයතනවල ශේෂ පැවරීමට හා පවරා ගැනීමට අදාල ජර්නල් සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම ශේෂ පවරාදීම ජ'නල් සටහන් මගින් සිදු නොකල බවත් 054 ශීර්ෂයේ සිට 193 ශීර්ෂයට ශේෂ මාරු කිරීම CIGAS මෘදුකාංගය මගින් පමණක් සිදු කල බවත් ඒ සඳහා පිළියෙල කළ ගිණුම් සාරාංශ ගොනු 02 ක් පිළියෙල කර ඇති බවත් තවදුරටත් ප්‍රකාශ කරමි. | 2020 නොවැම්බර් 30 දිනැති අංක 6/2020 දරණ මුදල් අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාග්ධන වැය විෂයන් 7 ක් සඳහා වෙන්කර තිබූ රු.13,850,000 ක ප්‍රතිපාදනයෙන් රු.6,875,341 ක් ඉතිරිකර තිබුණි. එය සියයට 16 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. | 2020 වර්ෂයේ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රටේ උත්ගත වූ තත්ත්වයත් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වීම මීට හේතුවයි. විශේෂයෙන් ඒ යටතේ වූ කාර්යයන් ඉටු කර ගැනීමට යහපත් වාතාවරණයක් රට තුල නොවූ බවත් ඇඳිරි නීති පැනවීම හා රට සම්පූර්ණයෙන් වසාදැමීම යනාදී ක්‍රියාකාරකම් ඉටු කර ගැනීමට හැකියාවක් නොවූ බව පෙන්වා දෙමි. එවන් අභියෝගාත්මක තත්ත්වයක් මධ්‍යයේ සතුටුදායක ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිවීම අප ලද ජයග්‍රහණයක් බව පෙන්වා දෙනු කැමැත්තෙමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කලයුතු වීම |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 22 ක් සඳහා වෙන්කර තිබූ රු.134,724,000 ක ප්‍රතිපාදනයෙන් රු.24,921,437 ක් එනම් සියයට 18.5 ක් වැය විෂයන්වල ඉතිරිකර තිබුණි. එය සියයට 13 සිට සියයට 100 දක්වා පරාසයක් තුල එම ඉතිරිකිරීම් පැවතුණි. | -එම- | -එම- |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

-------------------------------

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ---------------------- | | ---------------------------------------- | ------------ |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ බැරකම් භාණ්ඩාගාර සටහන්වල (SA-92) දක්වා තිබූ බැරකම්වලට වඩා රු.969,410 ක වෙනසක් නිරීක්ෂණය විය. | බැරකම් CIGAS පරිගණක මෘදුකාංගයට ඇතුලත් කිරීමට ලබාදී තිබූ අවසන් දිනය 2021 ජනවාරි මස 21 දක්වා පමණක් වූ බැවින් ඉන් පසුව වවුචර්පත් ලැබී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු දිනය වූ 2021 පෙබරවාරි 28 දක්වා වූ කාලයට ඇතුලත් කල බැරකම් ද බැරකම් ලේඛණයේ ඇතුලත් කිරීම මෙයට හේතුවයි. | අමාත්‍යාංශය විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම පියවීමට ඇති බැරකම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කල යුතු බව. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ප්‍රකාරව භාණ්ඩාගාරය වෙත වාර්තා නොකල කිසිදු බැදීමක් හෝ බැරකමක් 2021 වර්ෂය තුලදී නිරවුල් නොකල යුතු වුවත් භාණ්ඩාගාරයේ වාර්තා නොවූ, අවස්ථා 17 කට අදාලව රු.706,983 ක් වූ බැරකම් 2021 වර්ෂය තුලදී නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ සටහන් වී තිබුණු රු.91,501 ක් වටිනා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉහත (අ) හිදී පෙන්වා දුන් පරිදි මෙම සියලු බැරකම්වලට අදාල ගෙවීම් කිරීම වෙනුවෙන් ඇතුලත් කිරීම් හා ගෙවීම් කිරීම 2021 ජනවාරි මස 21 වන දිනට එනම් CIGAS පරිගණන මෘදුකාංගය හරහා ඇතුලත් කිරීමට අවසරය නොලැබීම මත පසුව ලද වවුචර් පත් සඳහා ගෙවීම් වන බැවිනි.<br>කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයට අදාල එකී රු.91,501 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් මගහැරී ඇත. එම ආයතනයට මෙවන් තත්ත්වයක් ඉදිරියේදී ඇතිවීම වළක්වාගන්නා ලෙස උපදෙස් දී ඇත. | -එම- |
| (ඇ) | රු.18,497 ක් වටිනා බැරකම්, අමාත්‍යාංශයේ බැරකම් ලේඛනයේ සටහන් කර තිබුණද මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | එම රු.18,497 ක වටිනාකමට අදාල බැරකම් මූල්‍ය ප්රකාශ ඉදිරිපත් කල දිනට ගෙවීම් වවුචර්පත් ඉදිරිපත් වී නොමැති වුවද 2020 වර්ෂයට අදාල බැරකම් වශයෙන් කල් ඇතිව හඳුනාගත් බැවින් (ගිණුම් සකසන දිනට) බැරකම් ලේඛණයට ඇතුලත් කිරීමට පියවර ගන්නා ලදී. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මු.රෙ. 94 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන නොමැති නම් කිසිම වියදමකට හෝ බැරකමකට නොබැඳිය යුතු අතර ඒ වෙනුවෙන් වූ වියදම ප්‍රතිපාදනය නොඉක්මවිය යුතුය. සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන ඉක්මවා රු.533,965 ක් වටිනා බැරකම්වලට එළඹ තිබුණි. | මෙම වගකීම් නිරවුල් කිරීම සඳහා වවුචර්පත් ලැබෙන විටත් මු.රෙ.69 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීමේ අවසන් දිනය ඉක්මවා තිබූ බැවින් ප්‍රතිපාදන සකසා ගැනීමට නොහැකි තත්ත්වයක් උදා විය. මන්ද එම වියදම් හඳුනාගනු ලැබූයේ 2020 වර්ෂය ඉකුත් වූ විටය. කෙසේ වුවද මෙම තත්ත්වය වලකා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ඉදිරියේදී ගැනීමට ක්‍රියාකරනු ලැබේ. | මු.රෙ. 94 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන නොමැති නම් කිසිම වියදමකට හෝ බැරකමකට නොබැඳිය යුතුවීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2008 පෙබරවාරි 06 දිනැති අංක 2008/05 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයේ සඳහන් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කලයුතු වුවත් 2020 වර්ෂයට අදාලව අමාත්‍යාංශය විසින් චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර නොතිබුණු අතර සේවා ප්‍රඥප්තියක් පිළියල කර තිබුණි. | පුරවැසි සේවා ප්‍රඥප්තිය හඳුන්වාදීම හිසින් යුතු 05/2008 හා 05/2008(1) යන චක්‍රලේඛ මගින් හඳුන්වාදී ඇති ආකෘතියට අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කර ඇත. එම චක්‍රලේඛවලට අනුව පුරවැසි ප්‍රඥප්තියක් හා සේවාලාභී ප්‍රඥප්තිය යනු එකම කරුණක් බැවින් විගණනයෙන් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ හා එකඟ විය නොහැකි බව කාරුණිකව දන්වමි. | චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කල යුතු වීම. |

**2.4 තැන්පත් ශේෂයන්**

තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සේවයේ නියුක්තව සිටියදී සේවකයින්ට වන මාරක නොවන අනතුරු හා මාරක අනතුරු හේතුවෙන් සේවායෝජක ආයතන වෙතින් වන්දි කොමසාරිස් කාර්යාලය අයකරගත් වන්දි මුදල්වලින් 2020 දෙසැම්බර් 31 වන විට රු.6,837,248 ක ශේෂයක් නිරවුල් නොකර පැවතුණි. සේවකයින් හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ නිවැරදි තොරතුරු නොමැතිවීම, ප්‍රතිලාභීන්ගේ වන්දි මුදල් ගෙවීමට අදාල ලියකියවිලිවල අඩුපාඩු පැවතීම හා ඒවා කාර්යාලය වෙත ඉදිරිපත් නොකිරීම යනාදී හේතු නිසා මෙම වන්දි මුදල් ගෙවීමට නොහැකිව පැවතුණු අතර එහි ප්‍රමාද කාලය මාස 05 සිට වර්ෂ 04 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | 2021 අප්‍රේල් 30 දිනට ඉතිරිව ඇති ශේෂය රු.4,279,719.21 කි. අනතුරකින් තුවාල ලබන සේවකයෙකුට හිමි වන්දි මුදල් ඔහුගේ නමින් පවතින බැංකු ගිණුමක තොරතුරු ගෙන්වාගෙන එම මුදල අදාල ගිණුමට බැර කරනු ලබයි. මෙහිදී සේවකයා බැංකු ගිණුම් විස්තර ඉදිරිපත් කිරීමට ප්‍රමාදවීම හා අක්‍රීය බැංකු ගිණුම් ඉදිරිපත් කිරීම මත වන්දි මුදල් ගෙවීමේ ප්‍රමාදයන් සිදුවේ.<br>අනතුරකින් මිය යන සේවකයන්ගේ වන්දි මුදල, වන්දි ආඥා පනතේ විධිවිධානයන්ට යටත්ව උසාවි පරීක්ෂණ මගින් වන්දි බෙදාදීමේ නියෝගය ලබාදීමෙන් අනතුරුව ඔවුන්ගේ ගිණුම්වලට බැර කරනු ලබයි. මෙම පරීක්ෂණය සඳහා ඉදිරිපත් නොවීම, අවශ්‍ය නෛතික ලියකියවිලි ඉදිරිපත් නොකිරීම වැනි හේතු මත ප්‍රදානය ලබාදීමට සැලකිය යුතු කාලයක් වැය වන බැවින් ප්‍රමාදවීම සිදුවේ. | වන්දි ආඥා පනතේ රෙගුලාසි ප්‍රකාරව හදිසි අනතුරුවලින් මියයන සේවා නියුක්තිකයන් ගේ යැපෙන්නන් සඳහා කඩිනමින් සහන ලැබෙන පරිදි කටයුතු කලයුතුවීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 හා 2020 වර්ෂයන් තුලදී සිදුවූ වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 වන විටත් මුදල් රෙගුලාසි අංක 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන්ව නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම වාහන අනතරු 04 සම්බන්ධව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩල පත්කර තිබුණද පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණු බව විගණන නිරීක්ෂණයෙන් හඳුනාගන්නා ලද අතර ඒ පිළිබඳව විගණනය වෙත ස්තුතිය පළ කරමි. එම නිරීක්ෂණයෙන් පසුව වහාම පරීක්ෂණ මණ්ඩල නැවත පත් කිරීමට කටයුතු කර ඇති අතර සංවරණ සීමා අවසන් වී සති දෙකක් තුල මු.රෙ. 104 පරීක්ෂණය අවසන් කිරීමට අපේක්ෂිත වේ. | වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104 හි දක්වා ඇති පරදි කටයුතු කලයුතු වීම |
| (ආ) | 2019 නොවැම්බර් 07 දින අනතුරට ලක්වූ අංක WPNC-6519 දරන වෑන්රථය සම්බන්ධව අමාත්‍යාංශයේ හානිපාඩු ලේඛණයේ සටහන්කර නොතිබුණි. | WPNC-6519 දරණ වෑන් රථය ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත තාවකාලිකව අනුයුක්ත කර තිබියදී එම අනුතුර සිදුවී ඇති අතර ඊට අදාල මු.රෙ.104 පරීක්ෂණය අවසන් කර ඇත. මෙම තොරතුරු අමාත්‍යාංශයේ හානි පසු ලාභයට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. | අවශ්‍ය අවස්ථාවලදී නිවැරදි තොරතුරු ලබාගත හැකි පරිදි ලේඛණ යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කලයුතු වීම. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | පිරිවැය රු.535,695 ක් වූ Sony HXR NX 5P වර්ගයේ වීඩියෝ කැමරාවක් අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන අනුමැතියද රහිතව සිංගප්පූරුවේ පිහිටි මව් සමාගම වෙත යවා තිබුණි. පසුව එම ඇස්තමේන්තු වටිනාකමට ප්‍රසම්පාදන අනුමැතිය නොලැබීම හේතුවෙන් කැමරාව නැවත මෙරටට ගෙන්වා තිබුණි. මේ සඳහා රු.15,000 ක ප්‍රවාහන ගාස්තු ගෙවීමට සිදුවී තිබූ අතර මෙම වීඩියෝ කැමරාවේ අලුත්වැඩියා කටයුතු සඳහා සිංගප්පූරුවේ මව් සමාගමෙන් එවන ලද රු.261,000 ක (කැමරාවේ වර්තමාන මිලෙන් සියයට 48 ක් පමණ වන) ඇස්තමේන්තුව 2019 දෙසැම්බර් 02 දින ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කර තිබුණු අතර, කැමරාව 2021 මාර්තු 30 දින වන විටද අමාත්‍යාංශය වෙත ගෙන්වාගෙන නොතිබුණි. | Sony HXR NX 5p වර්ගයේ වීඩියෝ කැමරාව සිංගප්පූරුවේ පිහිටි මව් සමාගම වෙත යැවීමට සිදුවී ඇත්තේ ලංකාවේ නියෝජිත හට එය ගලවා පරීක්ෂා කර ඇස්තමේන්තුවක් ලබාදීමට හැකියාවක් නොතිබුණු බැවිනි. එසේ සිංගප්පූරුවේ මව් සමාගම වෙත යවා ලබාගත් රු.261,000 ක ඇස්තමේන්තුව අනුව එම කැමරාව අලුත්වැඩියා කිරීම නිශ්කාර්ය වියදමක් බව ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇති හෙයින් එය අලුත්වැඩියා කර නොමැත. එබැවින් ප්‍රවාහන ගාස්තු රු.15,000 ක මුදල හා ගෙවිය යුතු අනෙකුත් ගාස්තු ගෙවා කැමරාව නැවත අමාත්‍යාංශය වෙත ලබා ගැනීම සඳහා ඉහත වියදම් දැරීමට ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදුකරමින් පවතින අතර එම අනුමැතිය ලද වහාම කැමරාව නැවත අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීම සිදුකරනු ඇත. | අමාත්‍යාංශය විසින් සිදුකරන සියලු වියදම් සම්බන්ධයෙන් කාර්යක්ෂමතාවය, ඵලදායීතාවය හා පිරිමැසුම් බව යනාදිය පිළිබඳව සැලකිලිමත්ව විය යුතු වීම. |
| (ආ) | 2016 අයවැය යෝජනා යටතේ ජූලි වර්ජකයන්ට සහන සැලසීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා 2016 අගෝස්තු 18 දින ජාතික අයවැය අධ්‍යක්ෂකගේ අංක BD/GPS/JS/2/14-2015 දරන ලිපිය මගින් ලබාදී තිබූ උපදෙස්වලට අනුව කටයුතු කරමින් අයඳුම්පත් නිර්දේශ කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින්ගේ අයදුම්පත් නිර්දේශ | විගණන විමසුමේ දක්වා ඇති පරිදි එකම ප්‍රතිලාභියා සඳහා අවස්ථා දෙකකදී අයඳුම්පත්‍ර නිර්දේශ කර අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හේතුවෙන් අතිරේකව ගෙවන ලද රු.1,000,000 (රු.250,000 × 4) ක මුදල අදාල ප්‍රතිලාභීන් වෙතින් නැවත අයකර ගැනීමට අවශය කටයුතු සිදුකරන ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීමට අවශ්‍ය පියවර ගෙන | ජූලි වර්ජකයන් සඳහා දීමනා නිර්දේශ කිරීමේදී අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබූ උපදෙස් පිළිපදිමින් ප්‍රතිලාභීන් පිළිබඳ වඩාත් නිවැරදි තොරතුරු මත පදනම්ව නිර්දේශ |

| | | | |
|---|---|---|---|
| | කිරීම, ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන්ගේ අයදුම්පත් නිර්දේශ කිරීම, පිළිගත නොහැකි දිවුරුම් ප්‍රකාශ සමඟ අයදුම්පත් නිර්දේශ කිරීම වැනි කටයුතු සිදුකර තිබුණි. 2020 දෙසැම්බර් මාසය වන තෙක් මෙම ක්‍රියාවලිය විධිමත්ව සිදු කර නොතිබුණි. එකම පුද්ගලයාගේ අයදුම්පත් දෙවරක් නිර්දේශ කිරීම නිසා පුද්ගලයින් 4 දෙනෙකු සඳහා රු.1,000,000 ක් වැඩිපුර ගෙවා ඇති බව නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය. | ඇත.<br>තවදුරටත් මේ සම්බන්ධයෙන් අදාල ප්‍රතිලාභීන් හට කරුණු වසන්කර මෙසේ දෙවරක් දීමනා ලබාගෙන ඇති බවට හා එසේ ලිපිලේඛන ඉදිරිපත් කිරීමෙන් සිතාමතා හෝ නොදැනුවත්ව රජයේ මුදල් අවභාවිතා කිරීමකට සහභාගී වී ඇති බවට දැනුම් දී නොපමාව අදාල මුදල් ගෙවන ලෙස ලිපියකින් දන්වා යැවීමට අවශ්‍ය පියවර ගෙන ඇත.<br>එසේම විගණන විමසුමෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නැවත සිදු නොවීමට අවශ්‍ය පියවර 2020 ඔක්තෝම්බර් 12 දින සිට ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් අදාල විෂය නිලධාරීන් හා අධීක්ෂණ නිලධාරීන් දැනුවත් කර ඇත. | නිකුත් කිරීම සිදුකල යුතු වීම. |
| (ඇ) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා තරඟාවලි 3ක් සඳහා රු. මිලියන 59.1 ක් වැය කරමින් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ ප්‍රධාන අරමුණක් වන ඵලදායිතා තරඟාවලිය හා සම්මාන උළෙල පැවැත්වීම හා ආයතන තෝරාගෙන සම්මාන ලබාදීම යනාදී කරුණු සිදුකලද සම්මාන ලබන ආයතනවල එම තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙනයාම පිළිබඳව පසු විපරම් කිරීමේ ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි. | ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලියේ සම්මාන දිනාගත් ආයතන ඵලදායිතා සංකල්ප අඛණ්ඩව පවත්වා ගෙනයාම පිළිබඳ අධීක්ෂණය කිරීමට 2020 වර්ෂයේ සිට සැලසුම් කර ඇත. එම ආයතනවල ඵලදායිතාවය මාස 06 කට වරක් අපගේ ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් මගින් නිරීක්ෂණය කිරීමට තීරණය කර ඇත. මේ පිළිබඳව ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කොට ඇති අතර 2020 ඵලදායිතා සම්මාන උළෙල අවසන් වූ පසු ආයතන නිරීක්ෂණය කිරීම එම නිලධාරීන්ගේ වාර්ෂික ඉලක්කයන්ට ඇතුලත් කෙරෙනු ඇත. | සම්මාන ලබාගත් ආයතනවල ඵලාදායීතාවය අඛණ්ඩව පවත්වා ගැනීමට පසුවිපරම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමද අවශ්‍ය වේ. |
| (ඈ) | අමාත්‍යාංශයට අනුබද්ධිත සියලු ආයතන මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් එක් කාල සීමාවකදී එක් දිස්ත්‍රික්කයක සිදුකිරීම තුලින් සේවා සේවක ප්‍රජාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් අරමුණු කරගෙන ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක වී | සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන් භාර අරමුදල් ප්‍රතිලාභ ලබාගැනීමේදී වතු ප්‍රජාවට මහත් ගැටලු රාශියකට මුහුණපෑමට සිදුවන අතර, අනවශ්‍ය ලෙස කාලය හා මුදල් නාස්තියක් සිදුවේ. මෙම ගැටලුව වැඩි | අරමුණු අනුව සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ජංගම සේවා පැවැත්වීම සිදුකල යුතු වීම. |

| | | |
|---|---|---|
| තිබුණි. නමුත් පසුගිය වසර 05 ක තොරතුරු විශ්ලේෂණයේදී නිරීක්ෂණය වූයේ ජංගම සේවා පවත්වා තිබුණේ බදුල්ල දිස්ත්‍රික්කයේ 04 ක් රත්නපුර දිස්ත්‍රික්කයේ 03 ක් හා කොළඹ දිස්ත්‍රික්කයේ 01 ක් වශයෙනි. එහෙත් අනෙක් දිස්ත්‍රික්කවල ජංගම සේවා නොපැවැත්වීමට හේතුන් හා බදුල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල ජංගම සේවා කිහිපයක් පැවැත්වීමට අදාල නිර්ණායකයන් පිළිබඳව විගණනයට කරුණු අනාවරණය නොවුණි. | වශයෙන් පවතින වතු ආශ්‍රිත ප්‍රජාව වැඩි වශයෙන් ජීවත් වන ප්‍රදේශ වල ජංගම සේවා වැඩසටහන් පැවැත්වීමේ අරමුණ වූයේ එම එම වතු ප්‍රජාවට සිදුවන අපහසුතා වැළැක්වීමයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දිස්ත්‍රික්කය තුල මෙම වැඩසටහන් පැවැත්වීම මගින් වඩා වැඩි ප්‍රතිලාභ අත්පත් කර ගත හැකි බව නිරීක්ෂණය වූ බැවින් මෙලෙස එක් දිස්ත්‍රික්කයක ජංගම සේවා වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. එසේ පැවැත් වූ නමුදු තවදුරටත් එම ප්‍රදේශවල මේ ගැටලු පවතින බවද නිරීක්ෂණය වේ. | |

## 4. යහපාලනය
---------------

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම
--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) වන්දි මුදල් නොගෙවීම නිසා වරෙන්තු වශයෙන් පවතින උසාවි 08 කට අදාල නඩු ගොනු 48 ක් පැවති අතර අනතුර වාර්තා වූ දින සිට 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවුරුදු 04 ත් අවුරුදු 24 ත් අතර කාල පරාසයක වන්දි ලෙස අයකරගත යුතු මුදල රු.12,988,494 ක් බව නිරීක්ෂණය විය. | කම්කරු වන්දි උසාවියේ තීන්දුව ප්‍රකාරව දින 30 ක් ඇතුලත වන්දි මුදල නොගෙවන්නේ නම් යෝජකයාගේ චංචල දේපල තහනමට ගෙන වෙන්දේසි කර එම මුදල් අයකර ගැනීම සඳහා සේවායෝජක පදිංචි ප්‍රදේශයට අයත් මහේස්ත්‍රාත් උසාවියේ රෙජිස්ටාර් වෙත වරෙන්තුවක් නිකුත් කරනු ලබයි.<br>ඒ අනුව, මෙම වරෙන්තු ක්‍රියාත්මක කිරීමට යාමේදී වගඋත්තරකරු විසින් වන්දි මුදල ගෙවීම සඳහා මහේස්ත්‍රාත් උසාවියේ රෙජිස්ටාර් වෙතින් කල් ලබා ගැනීම නිසාත් ඇතැම් වග උත්තරකරුවන්ගේ දේපල | වන්දි ආඥා පනතේ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල මුදල් කඩිනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු කලයුතු වීම |

| | | | |
|---|---|---|---|
| | | තහනමට ගත් පසු එම දේපල ඔවුන්ට අයත් දේපලක් නොවන බවට හිමිකම් නඩු පැවරීම හේතුවෙන් එම නඩුව අවසන් වන තෙක් වෙන්දේසි කිරීමට නොහැකිවීම මතද අයකර ගැනීම ප්‍රමාදවීම සිදුවේ. සිවිල් අධිකරණ ක්‍රියාමාර්ග අනුව එම වරෙන්තුව ක්‍රියාත්මකකරවා ගැනීම සඳහා වන්දි හිමිකරුවන් අධිකරණ රෙජිස්ටාර් හමුවී අවශ්‍ය සහයෝගය ලබාදිය යුතුය. මේ සම්බන්ධයෙන් හැකි සෑම අවස්ථාවකම ඔවුන් දැනුවත් කලද ඒ සඳහා ඉදිරිපත් නොවීම මත එම වරෙන්තු ක්‍රියාත්මක කර ගැනීමට ප්‍රමාද වී ඇති අතර බොහෝ අවස්ථාවලදී නොහැකි වී ඇත. | |
| (ආ) | වන්දි කොමසාරිස් කාර්යාලය වෙත වන්දි මුදල් තැන්පත් කලද නියම යැපෙන්නන් සොයාගැනීමට නොහැකිවීම නිසා වන්දි මුදල් බෙදා නොදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කම්කරු වන්දි කොමසාරිස් නමින් වෙන් වෙන් වශයෙන් ගිණුම් 6 ක් පවත්වා තිබූ අතර ඒවායෙහි තැන්පත් කර තිබූ මුදල 2020 දෙසැම්බර් 31 දිනට රු.2,023,095 ක් බව අනාවරණය විය. | දීර්ඝ කාලයක් වන්දි ලාභීන් ප්‍රධානය කරන ලද වන්දි මුදල් ලබා නොගැනීම මත ඔවුන්ගේ වන්දි මුදල සඳහා ප්‍රතිලාභයක් අත්කරදීමේ අරමුණින් කම්කරු වන්දි කොමසාරිස් නමින් ඉතිරි කිරීමේ ගිණුමක එම මුදල් තැන්පත් කරන අතර ආපසු ගෙවීමේදී එහි පොළියද සමඟ වන්දි ලාභීන් වෙත ගෙවීමට කටයුතු කරනු ලබයි. කම්කරු වන්දි කොමසාරිස් නමින් පවතින ඉතිරි කිරීම් ගිණුම් 06 න් එක් ගිණුමක් මේ වන විට වන්දි හිමිකරුවන් වෙත නිදහස් කිරීමට කටයුතු කර ඇත. | -එම- |
| (ඇ) | රැකියාවේ නියුතුව සිටියදී සිදුවූ මාරක අනතුරු හේතුවෙන් මියගිය සේවකයින්ගේ බාලවයස්කරුවන්ට හිමි වූ වන්දි වයස් පූර්ණත්වයට පත් වූ පසු එම මුදල් ඔවුන් වෙත ලබාදීම සිදුකල යුතු වුවද 2020 දෙසැම්බර් 31 දින වන විට වයස පූර්ණත්වයට පත්ව ප්‍රතිලාභ නිදහස් නොකරන ලද ගිණුම් 534 ක් පැවති අතර එම වන්දි | බාලවයස්කරුවන්ට හිමි වන්දි මුදල් ඔවුන් වයස සම්පූර්ණ වන තෙක් කම්කරු වන්දි කොමසාරිස් නමින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පත් කරනු ලබයි. එසේ තැන්පත් කරන ලද එහෙත් ගිණුම් හිමියන් සොයා ගැනීමට නොහැකිවීම හේතුවෙන් එහි සඳහන් ප්‍රතිලාභීන්ට වන්දි මුදල් | බාල වයස්කරුවන්ට හිමි වන්දි මුදල් වයස් පූර්ණත්වයට පත් බාල වයස්කරුවන් වෙත කඩිනමින් නිදහස් කිරීමට කටයුතු කලයුතු වීම. |

මුදල්වල වටිනාකම රු.20,861,229 ක් විය. ඒ තුල රු.11,782,761 ක් වූ 2016 වර්ෂයට පූර්ණත්වයට පත් ගිණුම් 459 ක්ද රු.8,563,187 ක් වූ 2020 වර්ෂය තුළ පූර්ණත්වයට පත් ගිණුම් 66 ක්ද විය.

නිදහස් කිරීමට නොහැකි වී ඇත. පැරණි ගිණුම්හි ශේෂයන් ඉතිරිවීමට හේතුපාදක වී ඇති කරුණු 5 ක් දක්වා තිබුණි.

නිදහස් කර නොගත් වන්දි මුදල් නිදහස් කර ගැනීම සඳහා 2021 මාර්තු 29 වන දින පැවති විගණන කළමණාකරණ රැස්වීමේදී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් කෙරිණි. ඒ සඳහා අමාත්‍යාංශය මගින් කමිටුවක් පත්කර තවදුරටත් තොරතුරු සොයා ගැනීමේ ප්‍රයත්නයක නියැලී ඇත. එමෙන්ම, ඉදිරියේදී එවැනි තත්ත්වයක් ඇති නොවීමට සියලු තොරතුරු (දෙමාපියන්, භාරකරුවන් හා සහෝදරයන් පිළිබඳ විස්තර) එක් පිටුවකට ගතහැකි වන සේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට යෝජනා වූ බව හා අනුගමනය කල යුතු පියවරයන් දක්වා තිබුණි.

මීට අමතරව 2018 ඔක්තෝම්බර් 06 වන දින දිනමිණ හා තිනකරන් පුවත්පත්හි පිළිවෙලින් සිංහල හා දමිළ භාෂාවෙන් දැන්වීමක් පළ කර ඇත.

2016 මාර්තු මස සිට බාලවයස්කාර ගිණුම් පරිගණක දත්ත පද්ධතියක් ආරම්භ කර එයට ඒ වන විට නිදහස් නොකර ලද සියලුම බාලවයස්කාර ගිණුම් තොරතුරු ඇතුලත් කර ඇත. මෙම දත්ත පද්ධතිය අනුසාරයෙන් වයස අවුරුදු 18 සම්පූර්ණ වූ වහාම ඔවුන්ට ඒ බව ලිපියක් මගින් දැනුම්දී අදාල කාලසීමාවේදී ගිනුම් නිදහස් කිරීමට කටයුතු කරනු ඇත. මේ හේතුකොට ගෙන 2016 වර්ෂයෙන් පසුව වයස සම්පූර්ණ වී ඇතත් නිදහස් කර නොගත් ගිණුම් සංඛ්‍යාව ඉතා සුළු ප්‍රමාණයකි.

## 5. මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විගණන නිරීක්ෂණය**

------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 15 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 75 | 47 | 28 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 34 | 27 | 07 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | 01 | 01 |
| | එකතුව | 138 | 93 | 45 |

**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**

------------------------------------

ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ද්විතියික මට්ටම්වලට අදාල බඳවාගැනීම් මෙම අභාත්‍යාංශය මගින් සිදු නොකරන, අමාත්‍යාංශයේ පාලනයෙන් පරිබාහිර කරුණු වේ. එබැවින්, එම පුරප්පාඩු පිරවීමට අදාලව ආමාත්‍යාංශය වෙත සිදු කල හැකි කාර්යය, එනම් අදාල ආයතනය වෙත පුරප්පාඩු පුරවන ලෙස දැනුම්දීම සිදුකර ඇත. ඒ අනුව, උපාධිධාරීන් බඳවා ගැනීමේ වැඩසටහන යටතේ බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් මෙම අමාත්‍යාංශය වෙත ලබාදී ඇති හෙයින් ද්විතීක මට්ටමේ පුරප්පාඩු පුරවා ඇත.

තවද, ප්‍රාථමික මට්ටමේ සියලුම සේවා ගණවලට අදාල නව බඳවා ගැනීම් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව අත්හිටුවා ඇති හෙයින් එම පුරප්පාඩු පිරවීමට මේ වන තෙක් හැකිවී නොමැත. ඒ පිළිබඳ විස්තර බහුකාර්ය සංවර්ධන බලකාය වෙත යොමුකර ඇත.

**නිර්දේශය**

-----------

අමාත්‍යාංශයේ අපේක්ෂිත කාර්යයභාරය වඩාත් කාර්යක්ෂමව ක්‍රියාවේ යෙදවීමට හැකි ලෙස මානව සම්පත ප්‍රශස්ථ හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අමාත්‍යාංශය කටයුතු කල යුතු